හෙක්ටර් කොබ්බෑකඩුව
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ
ආයතනය

# ගොවිකටයුතු පුවත් හසුන

වෙළුම 48 2024 පළමු වන කලාපය ISSN: 1994-040x




## ශ්‍රී ලංකාවේ වියළි කලාපීය දේශගුණික පාත්‍රියතාව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කතිකාව

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික පාත්‍රියතාව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කතිකාව, කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පෙබරවාරි 12 වන දින පැවැත්වුණි.

මෙම වැඩසටහන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය එක්ව සංවිධානය කරන ලද්දකි. දේශගුණික විපර්යාස හා දේශගුණික අනුහුරුවීම සම්බන්ධ ක්‍රියාකාරකම්වල නියැළී සිටින රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ඉහළ මට්ටමේ නිලධාරීන් අතර ඵලදායී සාකච්ඡාවකට පහසුකම් සැලසීම මෙම කතිකාවෙහි අරමුණ විය. තවද මෙහි තවත් එක් පරමාර්ථයක් වූයේ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවිජන අංශයේ දේශගුණික විපර්යාස ආශ්‍රිත ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට, විශේෂඥයින්ට, විද්වතුන්ට සහ සංවර්ධන වෘත්තිකයන්ට, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන නියෝජිතයින්ට තවදුරටත් පර්යේෂණ කළ හැකි ක්ෂේත්‍ර සහ තොරතුරු හා ප්‍රතිපත්තිමය අඩුපාඩු හඳුනා ගැනීමට, සාකච්ඡා කිරීමට වේදිකාවක් සැපයීමයි.

මෙම ආයතන ද්විත්වය විසින් විසින් සිදු කරන ලද දේශගුණික පාත්‍රීතාවය පිළිබඳ පර්යේෂණ සොයා ගැනීම් සහ නිර්දේශ විද්වත් මණ්ඩපය වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් සාකච්ඡාව ආරම්භ කරන ලදී.

කෘෂිකාර්මික අංශයේ දේශගුණික විපර්යාස බලපෑම්වලට සම්බන්ධ ප්‍රධාන උප අංශ හතරක් යටතේ (දේශගුණික අනුහුරුතාව, දේශගුණික අනුහුරු කෘෂිකාර්මික පිළිවෙත්, ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව, කාන්තාවන් සහ ළමුන් සහ කෘෂිකාර්මික නිෂ්පාදන සහ අලෙවිකරණ පද්ධති) පර්යේෂකයෝ සිව් දෙනෙක් කරුණු ඉදිරිපත් කළහ.



# අමාත්‍යංශ ලේකම්තුමා සහ පර්යේෂණ කාර්ය මණ්ඩලය අතර හමුවක්

**හෙ**ක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ජානක ධර්මකීර්ති මහතා අතර හමුවක් ජනවාරි 31 වැනි දින ආයතන පරිශ්‍රයේ දී පැවැත්වුණි.

2024 වර්ෂය සඳහා වන පර්යේෂණ, පුහුණු වැඩසටහන් සහ සන්නිවේදන සැලසුම් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම මෙහි අරමුණ විය.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම සහ නව වසර සඳහා විභවතාවක් සහිත පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී.

මෙම අවස්ථාවට ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී. ජී. බන්දුල මහතා, අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එන්.පී.ජී. සමන්ත මහතා ඇතුළු පර්යේෂණ කාර්ය මණ්ඩලය සහභාගී වූහ.







# 2024 නව වසරේ ආයතනයේ රාජකාරී ආරම්භය සනිටුහන් කරමින්

2024 වසරේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ රාජකාරී ආරම්භ කිරීම සනිටුහන් කිරීම සඳහා කෙටි චාම් උත්සවයක් ආයතන පරිශ්‍රයේ දී අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී බන්දුල මහතාගේ ප්‍රධානත්වයෙන් සහ කාර්යමණ්ඩලයේ සියලු දෙනාගේ සහභාගීත්වයෙන් ජනවාරි මස 01 වන දින පැවැත්විණි.

කාර්ය මණ්ඩලය විසින් රාජ්‍ය සේවක ප්‍රතිඥාව කියවීමෙන් අනතුරුව වැඩම කළ මහා සංඝ රත්නය විසින් සෙත් පිරිත් සජ්ජායනය කොට ආයතනයට, ආයතනයේ සේවක මණ්ඩලයට සහ සමස්ත රට වැසි ජනතාවට සෙත් පතා ආශිර්වාද එක් කළහ.

නව වසරේ සමාරම්භය සනිටුහන් කරමින් පැළයක් රෝපණය කිරීම ද අධ්‍යක්ෂතුමා අතින් සිදු වූ අතර එම අවස්ථාවට අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එන්.පී.ජී. සමන්ත මහතා, ලේඛකාධිකාරී බී.ආර්.සී. බණ්ඩාර මහතා ඇතුළු සියලුම අංශ ප්‍රධානීහු සහභාගී වූහ. වැඩසටහන අවසානයේ සියලුම කාර්ය මණ්ඩලය වෙනුවෙන් තේ පැන් සංග්‍රහයක් ද පැවැත්වුණි.

# පර්යේෂණ පුවත්



## ශ්‍රී ලංකාව තුළ කෘෂි සංචාරක ව්‍යාපාරය තිරසාර ජීවනෝපාය සංවර්ධන ඇති කිරීම උදෙසා යොදාගැනීම

ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ව්‍යාපාරය තිරසාර ජීවනෝපාය සංවර්ධන මාර්ගයක් ලෙස දියුණු කිරීමේ විභවතාවක් සහිත ක්ෂේත්‍රයක් ලෙස වර්ධනය වෙමින් පවතී. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ග්‍රාමීය සංවර්ධන අංශය විසින් ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ව්‍යාපාරය කේන්ද්‍ර කර ගනිමින් පර්යේෂණ අධ්‍යයනයක් ආරම්භ කර තිබේ. එහි අරමුණ වන්නේ කෘෂි සංචාරක ව්‍යාපාරය තිරසාර ජීවනෝපාය මාර්ගයක් ලෙස යොදා ගැනීමේ හැකියාව හඳුනා ගැනීමයි.

ඊට අමතරව,

- ගොවි ප්‍රජාව අතර කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේදී බලපාන සාධක (අභියෝග සහ අවස්ථා) හඳුනා ගැනීම
- දේශීය ජීවනෝපාය සංවර්ධනය කෙරෙහි පාර්ශ්වකරුවන්ට බලපානු ලබන විවිධ සාධකවල බලපෑම් හඳුනා ගැනීම
- දේශීය සහ ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන ඵලදායි කෘෂි සංචාරක ව්‍යාපෘති ගවේෂණය කිරීම

සහ එමගින් ග්‍රාමීය වශයෙන් ව්‍යපාර ආකෘතියක් සංවර්ධනය කිරීමට ඇති විභවයන් හඳුනා ගැනීම ද අනෙකුත් අරමුණු අතර වේ. පර්යේෂණ නිලධාරිනි නොරිකා අයෝමි මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සිදු කරන මෙම අධ්‍යයනය මධ්‍යම සහ දකුණු පළාත් තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතය.





# ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ පුහුණු වැඩසටහන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යාපන හා පුහුණු අංශය උතුරු පළාත ආවරණය වන පරිදි කාන්තාවන් සඳහා ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීම සඳහා ගෘහ මට්ටමින් අනුගමනය කළහැකි ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සංවිධානය කර තිබේ.

එහි ප්‍රථම අදියර මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක විය. එක් දින වැඩසටහන් පහක් වශයෙන් 2024 පෙබරවාරි 05 වන දින සිට පෙබරවාරි 09 වන දින දක්වා පැවති පුහුණු වැඩසටහන් සඳහා පුහුණුලාභීහු 225දෙනෙකු සහභාගී වූහ.

එම වැඩසටහන් මාලාවේ දෙවැනි අදියර වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් මාර්තු 11 වන දින ආරම්භ කරන ලදි. වව්නියා දිස්ත්‍රික්කයේ වව්නියා නගරය, වෙන්ගලචෙට්ටිකුලම්, වව්නියා දකුණ යන ප්‍රාදේශිය ලේකම් කොට්ටාස 3 ඉලක්ක කර ගෙන සිදු කරන ලදී.

පුහුණු වැඩසටහනේ අරමුණ වූයේ ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රදේශයන්හි සීමිත සම්පත් සහිත වටපිටාවක ජීවත් වන ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගෙන යාම සඳහා ගෘහ ඒකක මට්ටමින් සිදුකළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රජාවේ දැනුම, ආකල්ප වැඩි දියුණු කිරීම හා ඒ සඳහා ප්‍රජාව පෙළඹවීමයි.

වැඩසටහනේ අන්තර්ගය

- ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය වර්තමානයේ මුහුණ දෙන අභියෝග හා ඒවාට පිළියම්
- ගෙවත්ත ආශ්‍රිත බෝග හා සත්ත්ව නිෂ්පාදන කටයුතු සහ ආහාර සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම
- මූල්‍ය සාක්ෂරතාව සහ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම
- ආහාර පරිභෝජනයේ පෝෂණීය පැතිකඩ හා ආහාර සුරක්ෂිතතාව



පුහුණු වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යාපන හා පුහුණු අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි සුසිලා ලූර්දු මහත්මිය විසින් සිදු කරන අතර අධි පර්යේෂක එස්.එම්.ඒ සමරකෝන් මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය චතුර ජයම්පති යන මහත්වරු සහ බාහිර සම්පත් දායකයින් ලෙස උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ බැංකු ක්ෂේත්‍රයේ නිලධාරීන් පුහුණු වැඩසටහන සඳහා සම්බන්ධ වී සිටිති.



# 'Agritech 24'
# කෘෂි තාක්ෂණික දැක්ම බටඅත දී...



**කෘ**ෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යංශය සහ ඊට අනුබද්ධ සියලුම ආයතනවල සහභාගිත්වයෙන් 'Agritech 24' කෘෂි තාක්ෂණික දැක්ම කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් බටඅත කෘෂිතාක්ෂණ හා සංචාරක උද්‍යානයේ දී මාර්තු 02 වන දින සිට 05 වන දින දක්වා පැවැත්වුණි. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 37වන ආසියා පැසිෆික් සමුළුවට සමගාමීව මෙය සංවිධානය කර තිබුණි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රදර්ශන කුටියක් ද එහි විවෘතව පැවති අතර ප්‍රදර්ශනය පැවැති කාල සීමාව තුළ අප ආයතනයේ ප්‍රකාශන පිළිබඳ විස්තර ලබා ගැනීමට ජනතාවට අවස්ථාව හිමි විය.






# HARTI සුහද ක්‍රිකට් ගැටුම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ කාර්යමණ්ඩල සාමාජිකයින් අතර පැවැත්වෙන වාර්ෂික සුහද ක්‍රිකට් තරඟාවලිය පෙබරවාරි 17 දින වැලිකඩ බන්ධනාගාර ක්‍රීඩාපිටියේ දී පැවැත්වුණි.

J.S. ඉන්දික මහතාගේ නායකත්වයෙන් යුතු කණ්ඩායම ශූරතාවය දිනාගත් අතර අනුශූරතාවය දිනාගත්තේ නිරෝෂන් තරංග මහතා ප්‍රමුඛ කණ්ඩායමයි. හොඳම පිතිකරු ලෙස සම්පත් සාලියරත්න මහතා ශූරතාවය ජයග්‍රහණය කළ අතර හොඳම පන්දු යවන්නා ලෙස නිරෝෂන් තරංග මහතාත්, හොඳම පන්දු රැකීම සඳහා රෂාන් සූරියආරච්චි මහතාත් ශූරතාවය දිනා ගත්තේය. තරඟාවලියේ වීරයා වූයේ ඉන්දික පුෂ්පකුමාර මහතායි.

ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ක්‍රීඩා හැකියා ඔප්නංවා ගැනීම සහ කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීමේ අරමුණින් සුබ සාධක සංගමය විසින් වාර්ෂිකව මෙය සංවිධානය කරනු ලබයි.












# සුභසාධක සංගමයේ අරමුදල තර කිරීමට මෝටර් රථ සේදීමේ වැඩසටහනක්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබ සාධක සංගමයේ අරමුදල් තර කිරීමේ අරමුණින් මෝටර් රථ සේදීමේ වැඩසටහනක් සංවිධානය කරනු ලැබුණි. ආයතන පරිශ්‍රයේ ඉදිරිපස විජේරාම මාවතේ ගමන්ගත් මෝටර් රථ මුදල් අයකර පිරිසිදු කිරීම සහ එමගින් අරමුදල් ඉපයීමේ කාර්යය සඳහා කාර්යමණ්ඩලය සාමූහිකව දායක වූහ. එම අවස්ථාවේ ඡායාරූප කීපයක් මෙහි දැක්වේ...

# HARTI යූටියුබ් නාලිකාවෙන් නව වසරට වීඩියෝ වැඩසටහන් රැසක්

ගොවිජන හා ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයට සම්බන්ධ නවතම යාවත්කාලීන දැනුම සහ තොරතුරු වීඩියෝ වැඩසටහන් හරහා නැරඹීමට https://www.youtube.com/@HartiSriLanka යූටියුබ් නාලිකාවට පිවිසෙන්න.



ගොවිකටයුතු පුවත්සුන
2024 කලාපය 01

# ගොවිකටයුතු පුවත් හසුන


*උපදේශකත්වය*

ආචාර්ය ජී.ජී බන්දුල
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

*අධීක්ෂණය*
ශාන්ත හේවගේ
අංශ ප්‍රධාන
තොරතුරු හා සන්නිවේදන අංශය

*සම්පාදනය*

වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

*ගොවිකටයුතු පුවත්හසුන ප්‍රකාශනය, මුද්‍රණය සහ බෙදා හැරීම*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

0112 696981 - 0112 692423

www.harti.gov.lk
https://www.facebook.com/hartilk
https://www.instagram.com/harti_lk/
http://twitter.com/harti_lk


හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය
මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා
පුහුණු වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ හා පුහුණු තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරේ.

ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.

